පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
03

අවසාන වාර පරීක්ෂණය -2016

මව්බස

පාසලේ නම : .....

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : .....
.....

කාලය : පැය 1 ½යි.

- **ඡේදය කියවා ඒ ඇසුරින් ම පිළිතුරු සපයන්න.**

එදා පසළොස්වක පොහොය දවසක්. හඳ අහසේ බැබළෙමින් තිබුණා. සඳරුවන් ඇසිපිය නොගහා ඒ දෙස බලා සිටියා. හඳේ සමහර තැන් අඳුරුයි.

1. මෙම ඡේදයෙන් කියවෙන්නේ දවසේ කුමන කාලයක් පිළිබඳව ද?

.....

2. "චන්ද්‍රයා" යන්නට සමාන පදයක් ඡේදයෙන් සොයා ලියන්න.

.....

3. ඉහත ඡේදයේ කිසිඳු පිල්ලමක් යෙදී නොමැති වචනය සොයා ලියන්න.

.....

4. මෙහි සඳහන් ප්‍රාණවාචී නාම පදයක් ලියන්න.

.....

5. මෙහි ඇති මූර්ධජ අක්ෂරයක් යෙදී ඇති වචනයක් ලියන්න.

.....

(ල. 10)

02) පහත සඳහන් පද පෙරළි විසඳා පිළිතුර තිත් ඉරි මත ලියන්න.

i) ගීසිරිය - .....

ii) මත්තකොල්ලි - .....

(ල. 04)

Education NCP - www.edncp.lk

03) **සමානාර්ථ පද සොයා යා කරන්න.**

(අ)	(ආ)
1. දෙගුරුන්	පක්ෂීන්
2. නොකිපෙන	එළිය
3. කුරුල්ලන්	පැහැය
4. ආලෝකය	තරහ නොයන
5. පාට	මව්පියන්

(ල. 10)

04) **සුදුසු පද යොදා වගුව සම්පූර්ණ කරන්න.**

ඒක වචන	බහු වචන
1. මල	.....
2.	මලු
3. ගොවියා	.....
4.	පැළ
5. පාසල	.....

(ල. 10)

05) **පහත සඳහන් තේරවිලි කවිය කියවා පිළිතුර තිත් ඉර මත ලියන්න.**

ගේ අරගෙන ඇවිදින්නේ
දවල්ට මම හැංගෙන්නේ
එළවළු දලු කොළ කන්නේ .....
ගොවියගෙ සතුරෙක් වන්නේ

(ල. 2)

Education NCP - www.edncp.lk

06) ගැළපෙන වචනය යොදා හිස්තැන් පුරවන්න.

1. ..... (ශරීරයට / සරීරයට) ශක්තිය ලැබෙන්නේ අප කන කෑමවලින් ය.
2. ඒවාට ..... (දුරේක්ෂ / දුරේක්ස) කියලා කියනවා.
3. සීගිරි පර්වතය දුටු අපි ..... (විස්මයට / විෂ්මයට) පත් වූයෙමු.

(ල. 06)

07) පහත සඳහන් සිදුවීම්වල පිළිවෙළ අනුව අංක යොදන්න.

i) බුදුන්ට පූජා කරනවා. ☐

ii) මල් කඩනවා. ☐

iii) පැන් ඉහිනවා. ☐

(ල. 06)

08) ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.



හරහට

➢ ගොවියාට අවශ්‍ය උපකරණයකි.

පහළට

➢ කරේ පළඳින ආභරණයකි.

(ල. 04)

09) වචන ගලපා අර්ථවත් වැකි සාදන්න.

1. නරක / දෙයි / ගුරුතුමා / හොඳ / පෙන්වා

.....

2. රජතුමා / රටතොට / ගියේ ය / ඇවිදින්න / මහසෙන්

.....

(ල. 04)

Education NCP - www.edncp.lk

10) **පහත දී ඇති කවිය සම්පූර්ණ කරන්න.**

i. දිනක් බඩ ගින්නේ

සිවලෙක් තැවී උන්නේ

.....

ගොසින් මිදි වත්තකට වන්නේ

(ල. 02)

11) **නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

i) (වනය / වණය) තුළ තිබූ ගසක කිරි ගැවී සංජයගේ කකුලේ (වණයක් / වනයක්) සෑදී ඇත.

ii) (වල / වළ) තුළට ගිය මාමා, මාළුන් පිරි (වල / වළ) දෙස බලා සිටියේ ය.

(ල. 08)

12) **සුදුසු ක්‍රියා පදය ලියන්න.**

i) මම වෙළඳ පොළට .....

ii) අපි සෙල්ලම් .....

iii) ගස සුළඟට .....

(ල. 06)

13) **පහත සඳහන් වන්නේ පාසල් ළමා සමාජයට ඇතුළත් වීම සඳහා වූ අයදුම් පත්‍රයකි. ඔබේ තොරතුරු ඇසුරින් එය සම්පූර්ණ කරන්න.**

<u>අයදුම් පත්‍රය</u>

i. නම - .....

ii. ලිපිනය - .....

iii. පන්තිය - .....

iv. පාසල - .....

v. වයස - .....

(ල. 10)

Education NCP - www.edncp.lk

14) පහත සඳහන් වාක්‍යවලට සුදුසු විරාම ලකුණු යොදන්න.

i. අද ගහකොළවලට අලුත් පණක් ඇවිත් වගෙයි

ii. මහණ වෙලා වගේ නේ ද

(ල. 04)

15) ප්‍රශ්නය කියවා පිළිතුර තිත් ඉරි මත ලියන්න.

i. "මින්නේරි දෙවියෝ" ලෙස හැඳින්වෙන රජතුමා කවුද?

.....

ii. එතුමා ලංකාවේ කොස් වගාව දියුණු කිරීමට උනන්දු වී වැඩ කළ කෙනෙක්. මෙහි සඳහන් එතුමා කවුද?

.....

(ල. 06)

16) අලියා මහ ලොකුයි

හොඬ වැලත් දිගයි

ගඟේ දාලා නාවනකොට

කළු ගලක් වගෙයි

ඉහත කවියෙන් කියවෙන සතා පිළිබඳව වචන 4කට නොඅඩු වනසේ වාක්‍ය 3ක් ලියන්න.

1. .....

.....

2. .....

.....

3. .....

.....

(ල. 06)

(සමස්ත පිළිතුරු පත්‍රයේ පිරිසිදුකමට හා පැහැදිලි අත් අකුරු සඳහා ලකුණු 2ක් ප්‍රදානය කරන්න)

Education NCP - www.edncp.lk